රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 09/2015

මගේ අංකය : EST-9/POLIC/03/0235
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2015.04.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා, මණ්ඩල සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**<u>දේශපාලන හේතූන්මත විවිධ ගැටලුවලට මුහුණදුන් අයට සහන සැලසීම</u>**

2015.04.08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී 1994 සිට 2014 දක්වා වූ කාලය තුළ පත්වීම්, උසස්වීම්, ස්ථාන මාරු කිරීම් ආදී කටයුතුවලදී දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ගේ අභියාචනා පරීක්ෂා කර බලා සහන සලසාදිය යුතු බවට තීරණය කර ඇත.

02. එම කාල සීමාවට අදාළව දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන් 2015.05.05 දිනට පෙර තම අභියාචනා පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

03. එමෙන්ම ඉහත කාල සීමාවට අදාළව යම් පක්ෂ මූලස්ථාන කාර්යාලයකට ලැබී ඇති අභියාචනා ද ඉහත 02හි සඳහන් පරිදි අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන) වෙත එවීමට හැකි ය.

04. එසේ ලැබෙන අභියාචනා මවිසින් පත් කරනු ලබන කමිටුවක් වෙත ඉදිරිපත් කරනු ලැබේ. කමිටුව විසින් එකී අභියාචනා සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් සහ විනය චෝදනා පිළිබඳව වූ නිර්දේශ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාළ පරිපාලන බලධරයන් හා පත් කිරීම් බලධරයන් වෙත මවිසින් යොමු කරනු ඇත.

05. කමිටුව විසින් මූල්‍යාමය සහන ලබාදීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරනු ලැබුවහොත් එවැනි නිර්දේශ මහා භාණ්ඩාගාරය විමසා අවශ්‍ය ප්‍රතිපාදන ලබාගනිමින් ක්‍රියාත්මක කිරීම පිණිස පියවර ගන්නා ලෙසට මවිසින් අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුම්වත් කිරීමට පියවර ගනු ඇත.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය